සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)

ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

30079

ශ්‍රේණිය / தரம் / Grade: 8 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය / நேரம் / Time: පැය 2 යි

නම / பெயர் / Name ..............................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. තාත්තා **අත දිගහැර** අසරණයන් වෙනුවෙන් වියදම් කරයි.

(1) අතේ තිබූ දේ (2) නිර්ලෝභී ව
(3) ආවේගශීලී ව (4) කැමැත්තෙන්

2. ක්‍රීඩකයන් **ආවාට ගියාට** ක්‍රීඩා කරති' යි විචාරකයෝ පවසති.

(1) නොසැලකිලිමත් ව (2) තෝරාගත් නිසා
(3) සහභාගී කළ නිසා (4) අවිශ්වාසයෙන්

3. නිවැරදි ව අකාරාදි පිළිවෙළ යෙදුණු වරණය තෝරන්න.

(1) ඇපල්, පැපොල්, දිවුල්, කෙසෙල් (2) ඇපල්, කෙසෙල්, පැපොල්, දිවුල්
(3) ඇපල්, කෙසෙල්, දිවුල්, පැපොල් (4) පැපොල්, දිවුල්, කෙසෙල්, ඇපල්

4. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) මහළු, සමස්ත, නවීකරණය, ලක්ෂණ (2) ගැටළු, පිළිතුරු, නිෂ්ඵල, රක්ෂණය
(3) කුරුළු, නිෂ්පාදනය, අක්ෂරය, නිශ්ශබ්ද (4) සියලු, විශිෂ්ට, කෘත්‍රිම, කනිෂ්ඨ

5. මහාප්‍රාණ අක්ෂර යෙදී ඇති වචන පමණක් සහිත පිළිතුර තෝරන්න.

(1) ලේකම්, වර්ධනය, ප්‍රතිඵල, ප්‍රෞඪ (2) ලේඛන, ශිෂ්ටාචාරය, කණ්ඨජ, අර්ථය
(3) ලේඛකයා, ප්‍රබන්ධ, රූඪී, අධ්‍යාපනය (4) මර්දනය, සාකච්ඡාව, සංඝ, ලාභය

6. 'අනවරත' යන්නෙහි නිවැරදි තේරුම සහිත වරණය තෝරන්න.

(1) අනිවාර්යයෙන් (2) නිවැරදි
(3) උත්සාහය (4) නිරන්තර

7. 'වග' නම් බහ්වර්ථ පදයේ අර්ථය ප්‍රකාශ නොවන පදය කුමක් ද ?

(1) වලසුන් (2) රංචුව
(3) වර්ගය (4) තොරතුරු

8. මුලින් දී ඇති පදයට විරුද්ධ අර්ථය දෙන පදය සහිත වරණය තෝරන්න.

(1) වාසනාව - භාග්‍යය (2) ඌන - අනූන
(3) මෘදු - සිනිඳු (4) එළිය - අලු

9. ඉරි ඇඳි පදය කුමන ක්‍රියා පද වර්ගයට අයත්දැ'යි තෝරන්න.
"ගව්වෙන් ගව්ව දිව මාලිග **සැදේවා** "

(1) විධි ක්‍රියා
(2) පූර්ව ක්‍රියා
(3) ආශිර්වාද ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා

10. පහත වාක්‍යයේ ඉරි ඇඳි පදයට සාමානාර්ථයක් නොදෙන පදය තෝරන්න.
'ඈ ලක් **ධරණී** තලයට ඉමහත් කීර්තියක් රැගෙන ආවා ය.'

(1) මාතාව
(2) වසුන්ධරා
(3) මිහි
(4) පොළොව

11. 'දේශමාමකත්වය' යන පදයෙහි නිවැරදි අර්ථය වන්නේ ,

(1) තම රට පිළිබඳ හැඟීම
(2) නිහතමානීකම
(3) ගෞරවනීය නාමය
(4) ආත්මාර්ථකාමී බව

- **12 , 13 ප්‍රශ්නවල ඉරි ඇඳි පදය අයත් වන නාම පද වර්ගය තෝරන්න.**

12. 'මුහුදුබඩ ප්‍රදේශයන්හි **පොල්** ගස සරුවට වැඩෙයි.'

(1) ගුණ නාම
(2) සර්ව නාම
(3) සංඥා නාම
(4) ජාති නාම

13. 'අපි **දේශීය** ආහාරවලට මුල්තැන දෙමු.'

(1) තද්ධිත නාම
(2) සමාස නාම
(3) ක්‍රියා නාම
(4) සර්ව නාම

14. ' **බොහෝ කාලයක සිට පැවත එන** සිරිත් විරිත් වර්තමාන සමාජයෙන් ගිලිහී යමින් පවතී.' ඉරි ඇඳි පදවල අර්ථයට ගැළපෙන නිවැරදි තනි පදය තෝරන්න.

(1) බහුශ්‍රැත
(2) චිරාගත
(3) අනුකාරක
(4) සාරධර්ම

15. උක්ත පදයක් නොවන්නේ මින් කුමක් ද ?

(1) ශිෂ්‍යයෝ
(2) ශිෂ්‍යාවක්
(3) ශිෂ්‍යයෙක්
(4) ශිෂ්‍යාවක

- **හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

16. ශ්‍රී ලංකා ක්‍රීඩකයෝ දක්ෂ ලෙස ක්‍රීඩා ................................ .

(1) කළේ ය
(2) කළෙමු
(3) කළහ
(4) කළෙහු

17. ................................ වාර්තාව ඉදිරිපත් කළා ය.

(1) ලේකම්තුමෙක්
(2) ලේකම්තුමියක්
(3) ලේකම්වරු
(4) ලේකම්තුමියක

18. ගුරුවරු ................................ දැනුම්වත් කළහ.

(1) සිසුන්
(2) සිසුවෝ
(3) සිසුහු
(4) සිසුවියෝ

19. ගුණානන්ද හිමියෝ **අනතිමානී ගුණයෙන්** යුක්ත ව කටයුතු කළහ. ඉරි ඇඳි පදවල අර්ථයට යෙදෙන නිවැරදි තේරුම සහිත වරණය තෝරන්න

(1) අහංකාර
(2) නිරහංකාර ව
(3) සිහිනුවණින් යුක්ත ව
(4) පරාර්ථකාමී ව

20. යුගල පදයක් නොවන වරණය තෝරන්න.

(1) ඇත - මැත
(2) ළමයි - බමයි
(3) තාන්න - මාන්න
(4) රැවුම් - කෙරුම්

( ලකුණු 2 × 20 = 40 )

---

## II කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) 'පරාස්ස' පාඩම ඇසුරින් පිළිතුරු සපයන්න.

1. පරාස්ස නාට්‍යයේ ඔබ සිත්ගත් චරිත දෙකක් නම් කරන්න.
2. ඉන් ඔබට රඟපාන්නට ලැබුණු චරිතයක, චරිත ලක්ෂණ දෙකක් නම් කරන්න.
3. ඔබ එම චරිත රඟපාන්නට උදව් ලබාගත් ආකාර දෙකක් ලියන්න.
4. එම චරිත රඟපෑමේ දී ඔබ හෝ ඔබේ කණ්ඩායම හෝ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.
5. පරාස්ස නාට්‍යයේ ඔබ සිත් ගත් අවස්ථාවක් ඔබේ වචනයෙන් ලියන්න.

( ලකුණු 2 × 5 = 10 )

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.

1. අපේ රට අපි හදමු
2. ඉගෙනීමෙන් ලොව ජයගමු
3. සත්ත්ව සම්පත රැක ගනිමු
4. ගංවතුරට මැදි වූ මා

( ලකුණු = 20 )

(03) ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බෝ වන රෝගයක් පැතිර යන විට සියල්ලෝ ම ඒ ගැන කල්පනාකාරි වෙති. බෝ වන රෝගවලින් වැඩි කොටසකට ම හේතුව අපිරිසිදු ජලය යි. අපිරිසිදු ජලයෙහි විෂබීජ ඇති බැවින් ඒවා පාවිච්චි කිරීමෙන් රෝග හට ගනී. ජලය උණු කර ගැනීමෙන් විෂ බීජ නැසේ. එසේ පිරිසිදු කරගත් ජලය ම පාවිච්චි කිරීම අප පුරුද්දක් කර ගත යුතු ය. මේ පුරුද්ද රෝගයක් පැතිරෙන අවස්ථාවකට පමණක් සීමා කිරීම සුදුසු නැත. එසේ ම පොදුවේ ප්‍රයෝජනයට ගන්නා ළිං, වැව්, පොකුණු ආදිය අපවිත්‍ර නො කළ යුතු ය. පොදු දෙයක් පාවිච්චියට ගැනීමේ දී එය තමන්ගේ ම දෙයක් ලෙස සැලකීමට අප පුරුදු විය යුතු ය.

1. ඡේදයට අනුව සියල්ලන් ම කල්පනාකාරී වන්නේ කුමක් පිළිබඳව ද ?
2. බෝ වන රෝගවලින් වැඩි කොටසකට ම හේතුව කුමක් ද ?
3. ඡේදයට අනුව අප බෝ වන රෝගවලින් බේරී සිටීමට පුරුද්දක් කර ගත යුත්තේ කුමක් ද?
4. පොදු දෙයක් පාවිච්චියට ගැනීමේ දී අප පුරුදු විය යුතු ප්‍රධාන කරුණ කුමක් ද?
5. පහත සඳහන් වචනවලට සමාන අර්ථ පද ඡේදයෙන් උපුටා දක්වන්න.

(අ) අපිරිසිදු
(ආ) යෝග්‍ය

( ලකුණු 2 × 5 = 10 )

(04) 'පාසල මත්ද්‍රව්‍යවලින් තොර ආරක්ෂිත ආදර්ශවත් පාසලක් බවට පත් කරමු.' යන මැයෙන් සිසුන් දැනුම්වත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. පාසල් සෞඛ්‍ය සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න.

( ලකුණු = 10 )

(05) පෙළ පොත ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. කරන කලට පව් මීරි ය මී සේ
   ..............................................................
   ඇදින එ පව් දුර ලන උපදේසේ
   නුදුන මැනවි තුන් දොර අවකාසේ

   (අ) කවියේ දෙවන පදය සම්පූර්ණ කරන්න.

   (ආ) ඉහත කවිය ඇතුළත් කෘතිය කුමක් ද ?

2. "අද නම් යකෙක් කන්ඩ බඩගිනියි "

   (අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද?

   (ආ) මේ ප්‍රකාශය අසා සිටියේ කවුද ?

3. (අ) 'අවුරුදු සිහිනය' පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?

   (ආ) එම කෘතිය රචනා කළ කතුවරයා කවුද ?

4. (අ) ගුණානන්ද හිමියන් විසින් පවත්වන ලද පංචමහාවාදයන්ගෙන් එකක් නම් කරන්න.

   (ආ) ගුණානන්ද හිමියන්ගේ ගිහි කල නම කුමක් ද?

5. පහත සඳහන් ගීතවල රචකයන් නම් කරන්න.

   (අ) " සමන් පිච්ච මල් ඉහිරුණු "

   (ආ) " වැසි වසිනා අහස අපි "

( ලකුණු 2 × 5 = 10 )